# මධ්‍යම පළාත් කෙටි චිත්‍රපට උළෙල - 2021

ප්‍රස්තුතයක් තදාත්මීකරණය කරමින් සංස්කරණය කොට තනා නිම කරන ලද ප්‍රකාශන මාධ්‍ය වන ටෙලි නාට්‍යය හා චිත්‍රපටය අතරින් ප්‍රබල ලෙස ජනමනස සංජානනය කරනු ලබන මාධ්‍යයක් ලෙස චිත්‍රපට කලාව දැක්වීමට පුලුවන. ඒ මඟින් සමාජ සංචලනයට කරනු ලබන බලපෑම අනෙකුත් නිර්මාණ වලින් සිදුකරන බලපෑමට වඩා ඉහල මට්ටමක පවතින බවක් දක්නට පුළුවන.

චිත්‍රපටය මේවන විට මෙරට ප්‍රෙක්ෂකයින් අතරින් තරමක් දුරට ගිලිහී ගොස් ඇති බවක් දක්නට ලැබෙන නමුත් 1960, 70 දශක වලදී සිනමා ශාලා පිරී ඉතිරී යන තරම් ප්‍රේක්ෂක ආකර්ශනයක් දිනාගත් කලාවක් වී තිබුනි. නමුදු කාලයාගේ ඇවෑමෙන් බිහිවූ ඇතැම් චිත්‍රපට සඳහා ප්‍රේක්ෂක ආකර්ශනයක් දිනා ගැනීමට නොහැකි විය. රංගනය, අධ්‍යක්ෂණය, තේමාව , අන්තර්ගතය හා රූපවාහිනියේ ආගමනය ද මේ තත්වයට හේතු විය.

මෙලස කාලයාගේ ඇවෑමෙන් ජන මනසින් ඉවත්වෙමින් යන මෙරට ප්‍රචලිත කලා අංගයක් අනාගතයට ආරක්ෂාකාරීව දායාද කිරීමටත් චිත්‍රපට ක්ෂේත්‍රයට ඇල්මක් ඇති මුත් ඒ සඳහා අවස්ථාවක් නොමැතිව සිටි මැදරට කලාකරුවන් පිරිසකට ඒ සඳහා අවස්ථාවක් උදාකර දීමත්, අපේ ජනසමාජයෙන් ඈත්වෙමින් යන අස්පර්ශනීය උරුමයන් සමාජගත කිරීමටත්, ඒවා සංරක්ෂණය කිරීමත් යන අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මඟින් කෙටි චිත්‍රපට තරඟාවලියක් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම මෙම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කෙරේ.

**ඒමඟින්** - මධ්‍යම පළාතේ චිත්‍රපට කලාවට ඇල්මක් ඇති අධ්‍යක්ෂකවරුන්, නිෂ්පාදකයින් හා චිත්‍රපට කලාවට ප්‍රවේශ වීමට අපේක්ෂා කරන අපේම ආධුනිකයින් පිරිසක් චිත්‍රපට කලාවට හඳුන්වා දීමට අපේක්ෂා කරමි.

**මෙම අරමුණ තුලින් -**

# වාර්තා චිත්‍රපටකරණය මඟින් කාලයේ වැලිතලාවෙන් වැසීයන අපේ අස්පර්ෂනීය උරුමය සංරක්ෂණය කිරීම.
# වෘතාන්ත චිත්‍රපටකරණය මඟින් සමාජ සංසිද්ධීන් දෙස නිර්මාණශීලීව දකින නිර්මාණශීලීන් බිහිකිරීම.
# චිත්‍රපට නිර්මාණකරණයට දක්ෂ නිර්මාණශීලීන් පිරිසක් ජාතික තලයට හඳුන්වා දීම.
# නිර්මාණකරණ හැකියාවන් ප්‍රගුණ කරගත් නව යොවුන් පිරිසකට ජීවන ගමන්මඟ එළිපෙහෙලි කරදීම.
වැනි අවශේෂ අරමුණු ද සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කරමි.

**මෙම අපේක්ෂා අරමුණු ඉටුකර ගැනීමට -**

# තරඟාවලිය පිළිබඳව දෙපාර්තමේන්තු වෙබ් අඩවිය මඟින් ප්‍රචාරය කිරීම.
# ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල දෙපාර්තමේන්තු සංස්කෘතික නිළධාරින් මඟින් දැනුවත් කිරීම.
# පෙර වසරවල තරඟකරුවන් දැනුවත් කිරීම මඟින් අයදුම්පත් ලබාගැනීම.
# ඒ මඟින් - 01. ස්පර්ෂණීය / අස්පර්ෂණීය උරුමයන් ඇසුරින් වාර්තා කෙටි චිත්‍රපට
02. තෙවන පාර්ශවයකට අගතියක් නොවන අභිමත තේමාවක් පාදක කරගත් වෘතාන්ත කෙටි චිත්‍රපට ලෙස අංශ දෙකක් යටතේ අයදුම්පත් ලබාගැනීම සිදුකරනු ලබන අතර
# එලෙස අයදුම්පත් යොමුකරනු ලබන අයදුම්කරුවන් සඳහා චිත්‍රපට ක්ෂේත්‍රයේ ප්‍රවීන දේශකයින් මඟින් පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
# නිෂ්පාදනය කරනු ලබන කෙටි චිත්‍රපට D V D තැටි 02 බැගින් ලබාගැනීම.
# නිර්මාණ විනිශ්චය කර ජයග්‍රාහී නිර්මාණ හා ජයග්‍රාහකයින් ඇගයීමට ලක්කිරීම.

ජයග්‍රහණය කරනු ලබන නිර්මාණ හා ශිල්පීන් සඳහා ( කුසලාන,සහතික පත්, මුදල් ත්‍යාග )

| | | |
|---|---|---|
| 01. | හොඳම නිෂ්පාදනය | 20,000.00 |
| 02. | හොඳම වෘතාන්ත කෙටි චිත්‍රපටය | 20,000.00 |
| 03. | හොඳම වාර්තා කෙටි චිත්‍රපටය | 20,000.00 |
| 04. | හොඳම තිර පිටපත | 15,000.00 |
| 05. | හොඳම පර්යේෂණාත්මක මැදිහත්වීම | 15,000.00 |
| 06. | හොඳම සමාජීය මැදිහත්වීම | 15,000.00 |
| 07. | හොඳම නළුවා | 10,000.00 |
| 08. | හොඳම නිළිය | 10,000.00 |
| 09. | හොඳම කැමරාකරණය | 10,000.00 |
| 10. | විශිෂ්ඨ නිර්මාණ කුසලතා ( 5 x 5000 ) | 25,000.00 |

තරඟ කොන්දේසි -

01. අයදුම්කරුවන් මධ්‍යම පළාතේ ස්ථිර පදිංචි කරුවන් විය යුතුය.
02. අයදුම්කරු නිර්මාණයේ අධ්‍යක්ෂක විය යුතුය.
03. තමන් අභිමත කැමරාවක් භාවිතා කරමින් විනාඩි 10 - 15 අතර කාලයකට නිර්මාණය සීමා විය යුතුය.
04. වාර්තා / වෘතාන්ත දෙඅංශයෙන් කෙටි චිත්‍රපට ඉදිරිපත් කල හැකි අතර, එක් අංශයකින් එක් චිත්‍රපටය බැගින් අංශ දෙක සඳහාම චිත්‍රපට ඉදිරිපත් කල හැකිය.
05. නිර්මාණය කරන ලද චිත්‍රපටය කතා සාරාංශය,චරිත අපේක්ෂාවන් හා ස්වභාවය, කතාවේ දෘෂ්ඨිය සමඟ එක් අංශයකින් D V D තැටි 02 බැගින් ලබාදිය යුතුය.
06. ඉදිරිපත් කරනු ලබන කෙටි චිත්‍රපට කුමන හෝ ආකාරයේ රාජ්‍ය තරඟාවලියක් ජයග්‍රහණය නොකල එකක් විය යුතුය.
07. වෘතාන්ත චිත්‍රපටය තමන් අභිමත තේමාවක් විය හැකි වුවත් ඒ මඟින් කිසියම් ආගමක්,ජාතියක්, භාෂාවක්,පුද්ගලයෙක්,ආයතනයක්,දේශපාලන පක්ෂයක් විවේචනය නොවිය යුතු අතර, ලිංගික හෝ අසභ්‍ය දර්ශන හා මත් ද්‍රව්‍ය භාවිත දර්ශන ඇතුලත් නොකල යුතුය.
08. වාර්තා කෙටි චිත්‍රපටය ස්පර්ශනිය / අස්පර්ශනීය උරුමයන් පදනම් කරගත් එකක් විය යුතුය.
09. තරඟාවලිය සඳහා අයදුම්පත් 2021.04.30 ට පෙර ද නිෂ්පාදනය කරනු ලබන කෙටි චිත්‍රපට D V D තැටි 2021.06.30 ට පෙර අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, යටිනුවර වීදිය,මහනුවර. ලිපිනයට තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් බාරදීමට හැක. එසේ නැතහොත් ඔබගේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පළාත් සංස්කෘතික නිළධාරි වෙත හෝ පළාත් සංස්කෘතික සංවර්ධන නිළධාරි වෙත බාරදීමට පුළුවන.
10. චිත්‍රපට කලාවේ ප්‍රවීන විනිශ්චය මණ්ඩලයක් මගින් විනිශ්චය කිරීමෙන් පසු එම විනිශ්චය පළාත් අධ්‍යක්ෂකගේ අනුමැතියෙන් අවසන් තීරණය බවට පත්වේ.
11. විනිශ්චය මණ්ඩල තීරණ මත ත්‍යාග සම්මාන කුසලාන පිරිනැමීම තීරණය වන අතර ජයග්‍රාහී නිර්මාණය සම්මාන ප්‍රදානෝත්සවයේ දී අධ්‍යක්ෂකගේ අභිමතය පරිදි තිරගත කිරීමට කටයුතු කරනු ඇත.
12. හොඳම කෙටි චිත්‍රපට සම්මානය පිරිනැමීම සඳහා අවම වශයෙන් තවත් ඇගයීම් දෙකක් වත් එම චිත්‍රපටය හිමිකර ගෙන තිබිය යුතුය.
13. නිර්මාණකරණයේ දී දක්වන ලද විශිෂ්ඨ කුසලතාවය ඇගයීමට තෝරාගනු ලබන චිත්‍රපට පහක් සඳහා ත්‍යාග සහතිකපත් ප්‍රදනය කිරීමට කටයුතු කරනු ලැබේ.
14. නිර්මාණය ස්ව නිර්මාණයක්ම විය යුතු අතර තරඟ විනිශ්චයේ දී එසේ නොවන බව හැඟී ගිය විටකත්‍යාග සම්මාන සඳහා සලකා නොබලනු ඇත.
15. තරඟාවලිය සම්බන්ධව සියළු තීරක බලය මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තු අධ්‍යක්ෂකවරයා සතුවේ.

ස්වර්ණා පෙරේරා,
පළාත් අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
මධ්‍යම පළාත් සභාව, මහනුවර.

මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව
කෙටි චිත්‍රපට තරඟ අයදුම්පත්‍රය
**2021**

**01.** අයදුම්කරුගේ නම ( අධ්‍යක්ෂක ) **---------------------------------------------------------------------**

**02.** ලිපිනය **- -----------------------------------------------------------------------------------------------**

**03.** හැඳුනුම්පත් අංකය **- ------------------------------------------------------------------------------------**

**04.** ඊ මේල් ලිපිනය **- -----------------------------------------------------------------------------------------**

**05.** දුරකථන අංක **-** ජංගම **--------------------------------------**නිවස **-------------------------------------**

**06.** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය **- -------------------------------------------------------------------------**

**07.**කෙටි චිත්‍රපටයේ නම **- ------------------------------------------------------------------------------------**

**08.** කෙටි චිත්‍රපටයේ ස්වභාවය **-** ( වාර්තා / වෘතාන්ත ) **- -------------------------------------------------**

මා විසින් මෙම ඉල්ලුම්පත්‍රයේ සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මා විසින් ඉදිරිපත් කරනු ලබන කෙටි චිත්‍රපටය ජයග්‍රහණය කරනු ලැබුවහොත් පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවන්ට අනුකූලව ප්‍රදර්ශනය කිරීමට එකඟවන අතර, මා විසින් සපයා ඇති තොරතුරු අසත්‍ය බව හෝ ව්‍යවස්ථාවේ කරුණු උල්ලංඝනය කිරීමක් සිදුවී ඇති බව අනාවරණය වන කුමන අවස්ථාවකදී හෝ මධ්‍යම පළාත් කෙටි චිත්‍රපට තරඟාවලියෙන් ඉවත් කිරීමේ අයිතිය මධ්‍යම පලාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට ඇති බව පිළිගන්නා බවත් ප්‍රකාශ කරමි.

දිනය -                                        අත්සන -

--------------------------------------------------------------------------------------------------------------

පළාත් සංස්කෘතික නිළධාරි නිර්දේශය

පළාත් අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

--------------------------------------------------- නම සඳහන් මෙම අයදුම්කරු /කාරිය -------------------
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ------------------------------- ග්‍රාම නිළධාරි වසමේ පදිංචි අයකු බව සහතික කරමි.

දිනය -                    අත්සන                    නිළමුද්‍රාව